# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2345/45 - 2023 අගෝස්තු මස 16 වැනි බදාදා - 2023.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික පොලිස් කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඒ වන ව්‍යවස්ථාව යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති.

ඊ. ඩබ්ලිව්. එම්. ලලිත් ඒකනායක,
සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

2023 අගෝස්තු මස 16 වැනි දින,
කොළඹ 07,
බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,
09 වන ගොඩනැගිල්ල,
ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීති**

01. මෙම රීති, **"2023 ජාතික පොලිස් කොමිෂන් සභා (අභියාචනා කාර්ය පටිපාටික) රීති"** යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උෟ. සහ 155එ. ව්‍යවස්ථා යටතේ පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීම සඳහා පත් කරන ලද කමිටුවක් විසින් හෝ පොලිස්පතිවරයා විසින් හෝ පොලිස් නිලධරයෙකු විසින් හෝ කරනු ලැබූ උසස් කිරීමක්, ස්ථාන මාරු කිරීමක්, විනය කාරණයක් නිසා කරනු ලැබූ යම් නියෝගයක් හෝ සේවයෙන් පහ කිරීමක් සම්බන්ධයෙන් කරනු ලැබූ යම් නියෝගයක් හේතු කොට ගෙන අතෘප්තියට පත් වන යම් පොලිස් නිලධරයෙකුට ඔහු/ඇය සම්බන්ධයෙන් වන එවැනි නියෝගයකට එරෙහිව ලිඛිත අභියාචනයක් මෙහි පහත නියමකර ඇති රීති යටතේ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකිය.

1A - PG 6448 — 106 (2023/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

03. එවැනි නියෝගයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත එක් නිලධරයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අභියාචනයක් පමණි. එකී අභියාචනය ඉදිරිපත් කිරීමේදී, තම අභියාචනයේ සඳහන් කරුණු මෙන්ම අභියාචනයේ සඳහන් කරුණු තහවුරු කරමින් ඉදිරිපත් කරනු ලබන ලේඛනද, සත්‍යවූත්, නිවැරදිවූත් ලේඛන බවට අභියාචනය ඉදිරිපත් කරන පොලිස් නිලධරයා විසින් දිවුරුම් ප්‍රකාශයක් මගින් තහවුරු කළයුතුය.

තවද, එවැනි දිවුරුම් ප්‍රකාශයක පහත සඳහන් දෑ සඳහන් කළ යුතුය :-

(අ) මෙම ප්‍රශ්න ගත කරුණට අදාළව/සම්බන්ධයෙන් මීට පෙර වෙනත් අභියාචනයක් ඉදිරිපත් කර තිබේද යන්න ;

(ආ) මෙම ප්‍රශ්න ගත කරුණ හා සම්බන්ධයෙන් යම් නීතිමය කටයුත්තක් පවතින්නේද නැතහොත් ඒ සම්බන්ධයෙන් එවැනි නීතිමය කටයුත්තක් අවසන් වී තිබේද යන්න;

(ඇ) එසේනම් අදාළ යොමු/නඩු අංක සහ වෙනත් අදාළ විස්තර

04. (අ) සෑම අභියාචනයක්ම කොමිෂන් සභාවේ ලේකම් අමතා එවිය යුතු වන අතර එසේ එවීමේ දී ලියාපදිංචි තැපෑලෙන් හෝ කොමිෂන් සභාවේ විද්‍යුත් තැපැල (info@npc.gov.lk) වෙත එවිය යුතුය. නැතහොත් ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යාලයට අතින් ගෙනැවිත් භාර දිය යුතු අතර අභියාචනය ලැබුණු බවට කුවිතාන්සියක් කොමිෂන් සභාව විසින් නිකුත් කළ යුතුය.

(ආ) අභියාචනය ඉදිරිපත් කරනු ලබන අභියාචක සම්බන්ධයෙන් පහත සඳහන් මූලික කරුණුද එම අභියාචනයේ සඳහන් කළ යුතුය.

1. හැඳුනුම්පත් අංකය
2. නිලය/ නිල අංකය
3. වර්තමාන ලිපිනය
4. දුරකථන අංකය
5. වර්තමාන හෝ අවසන් වරට සේවය කල ස්ථානය
6. විද්‍යුත් ලිපිනය (ඇත්නම්)

05. (අ) අවස්ථාවෝචිත පරිදි කමිටුව හෝ පොලිස්පතිවරයා හෝ පොලිස් නිලධරයෙකු විසින් කරනු ලැබූ නියෝගය නිසා අතෘප්තියට පත් පාර්ශ්වය විසින් එකී අභියෝගයට ලක්කරනු ලබන නියෝගය ලද දිනයේ සිට **මාස හයක (06)ක** කාලයක් තුළ සෑම අභියාචනයක්ම ඉදිරිපත් කළ යුතු ය.

(ආ) එසේ වුවද, එකී අභියාචනයේ ඉදිරිපත් කර ඇති කරුණු වල සාධාරණත්වය සහ සිද්ධි වලට බලපෑ හේතු සහ අවස්ථාවන් සලකා බලා ජාතික පොලිස් කොමිෂන් සභාව විසින්, කොමිෂන් සභාවේ පූර්ණ අභිමතය පරිදි, යම් අභියාචනයක් පිළිගැනීම සලකා බැලිය හැක්කේ මෙහි නියම කර ඇති මාස 06 ක කාලය තුළ අභියාචනය ගොනු කිරීමෙන්/ ඉදිරිපත් කිරීමෙන් අතෘප්තියට පත් පාර්ශ්වය වලක්වාලනු ලැබූ **සුවිශේෂ හේතු සාධක** පෙනෙන්නට ඇත්නම් පමණි. එබඳු අවස්ථාවක දී, නියමිත මාස හයක කාල සීමාව තුළ අභියාචනය ඉදිරිපත් කර නැත යන කරුණ කොමිෂන් සභාව විශේෂයෙන් සඳහන් කළ යුතු වන අතර එකී අභියාචනයේ ඇති **සුවිශේෂී හේතු සාධක** පදනම් කර ගෙන පමණක් එකී අභියාචනය සලකා බලන ලද බවද සඳහන් කළ යුතු ය.

06. ඉහත නිශ්චිත වශයෙන් සඳහන් කොට ඇති රීති වලට අනුව ඉදිරිපත් නොකරන ලද අභියාචනා ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. (අ) අභියාචනයක් විභාග කරන අවස්ථාවේ දී,

i. අවස්ථාවෝචිත පරිදි අදාළ කමිටුවෙන්, පොලිස්පතිවරයාගෙන් හෝ පොලිස් නිලධරයෙකුගෙන් වාර්තා, නිරීක්ෂණ, ලිපි ගොනු හෝ අදාළ වෙනත් ලිපි ලේඛන කැඳවීම සහ,

ii. අභියාචක නිලධරයා කොමිෂන් සභාව ඉදිරියට කැඳවීමට, කොමිෂන් සභාවට හැකිය.

(ආ) මෙම ඡේදය යටතේ අදාළ ලිපිගොනු සහ අනෙකුත් අදාළ ලේඛන කැඳවා ඇති විට, එබඳු ඉල්ලීමක් ලද දිනයේ සිට මාසයක් නොඉක්මවන කාල සීමාවක් තුළ ඊට අනුකූලතාවය දැක්වීම අවස්ථාවෝචිත පරිදි අදාළ කමිටුවේ, පොලිස්පතිවරයාගේ හෝ පොලිස් නිලධරයාගේ රාජකාරිය විය යුත්තේය.

08. යම් අභියාචනයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තීරණය/ තීන්දුව, එම තීරණය ගත් දින සිට දින තිහක් ඇතුළත අවස්ථාවෝචිත පරිදි අභියාචක නිලධරයා වෙත සහ කමිටුව, පොලිස්පතිවරයා, හෝ පොලිස් නිලධරයා වෙත දැන්විය යුතු ය. අභියාචනයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව තීරණයක්/ තීන්දු ප්‍රකාශයක් ලබාදී ඇති විට, ඉහත සඳහන් පරිදි කොමිෂන් සභාව දැනටමත් තීරණයක් ලබාදී ඇති අදාළ විෂය කරුණ සම්බන්ධයෙන් තවදුරටත් අභියාචනා සහ/හෝ ඉල්ලුම්පත්‍ර සහ/හෝ ඉල්ලීම් කොමිෂන් සභාව විසින් භාර නොගත යුත්තේය.

09. "කොමිෂන් සභාව" යන්නෙන් මෙහිදී අදහස් වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති "ජාතික පොලිස් කොමිෂන් සභාව" වේ.

10. 2016 දෙසැම්බර් 15 වන බ්‍රහස්පතින්දා, දින අංක 1997/23 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කළ **"2016 ජාතික පොලිස් කොමිෂන් සභාවේ අභියාචන කාර්ය පටිපාටික රීති"** මෙයින් අවලංගු වන්නේ ය.

EOG 08 -0174